[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 1999 අංක 47 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 10 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1999 දෙසැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8. 00 තැපැල් ගාස්තුව : රු.3.50

**1999 අංක 47 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 10 වැනි දින.]

එල්.ඩී. – ඕ. 33/99.

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත 1999 අංක 47 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

*1979 අංක 15 දරන පනතේ 303 සහ 304 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන සහ 304 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :-

*"බන්ධනාගාරගත කිරීමේ අත්හිට වූ දණ්ඩන නියමය*

303. (1) මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, වරදකරුවකු කිසියම් කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීමේ දී අධිකරණයක් විසින් :-

(අ) දණ්ඩන නියමය කරනු ලැබුවේ යම් වරදක් සම්බන්ධයෙන් ද, ඒ වරද සඳහා නියමිත උපරිම දණ්ඩනය ;

(ආ) වරදේ ස්වභාවය සහ වරදේ බරපතලකම ;

(ඇ) වරද සඳහා වරදකරුගේ සදෝෂත්වය සහ වගකීමේ ප්‍රමාණය ;

(ඈ) වරදකරුගේ පූර්ව කල්ක්‍රියාව ;

(ඉ) වරද සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කෙලින්ම සිදු වූ යම් හානියක්, පාඩුවක් හෝ අලාභයක් ;

H-022545

(ඊ) වරදකරු හා සම්බන්ධ වූ දඬුවම උග්‍ර කිරීමට හෝ ලිහිල් කිරීමට තුඩු දෙන සාධක කිසිවක් තිබීම ;

(උ) සියලු අවස්ථානුගත කරුණු අනුව සාධාරණ වන ප්‍රමාණයකට සහ ආකාරයකට වරදකරුට දඬුවම් පැමිණවීමට ඇති අවශ්‍යතාව ;

(ඌ) එම ස්වාභාවයේ හෝ සමාන ස්වභාවයක වැරදි සිදු කිරීමෙන් වරදකරු හෝ වෙනත් තැනැත්තන් වළක්වාලීමට ඇති අවශ්‍යතාව ;

(එ) වරදකරු නිරතව සිටියේ කවර ස්වරූපයක ක්‍රියාකලාපයක ද, ඒ ක්‍රියාකාලාපය, අධිකරණය විසින් ප්‍රතික්ෂේප කිරීම ප්‍රත්‍යක්ෂ කිරීමේ අවශ්‍යතාවය ;

(ඒ) වරදට භාජනය වූ තැනැත්තා හෝ ප්‍රජාව වරදකරුගෙන් ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව ;

(ඔ) වරදට චෝදනා ලැබූ තැනැත්තා වරදට වරදකරු බව පිළිගැනීම සහ ඒ තැනැත්තා අවංකව සහ සත්‍ය ලෙස පසුතැවිලි වන බව ; හෝ

(ඕ) ඉහත සඳහන් කරුණු වලින් කරුණු දෙකක් හෝ ඊට වැඩි එකතුවක්,

යන කරුණු සැලකිල්ලට ගෙන, අවස්ථානුගත කරුණු අනුව, දණ්ඩන නියමය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ අත්හිටුවීම යෝග්‍ය යයි අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, ලිඛිතව සඳහන් කළ යුතු හේතු අනුව, අධිකරණය විසින් දණ්ඩන නියමය සම්පූර්ණයෙන් ම හෝ එම දණ්ඩන නියමයෙන් යම් කොටසක් හෝ අත්හිටුවමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (අ) දණ්ඩන නියමය කරනු ලැබුවේ යම් වරදක් සම්බන්ධයෙන් ද, ඒ වරද සඳහා නීතිය මගින් විධානාත්මක අවම බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක්, නියම කරනු ලැබ ඇත්නම් ; හෝ

(ආ) වරදකරු, අත්හිටුවනු ලැබ නොමැති බන්ධනාගාරගත කිරීමේ කාලයක් දඬුවම් විඳිමින් සිටී නම් හෝ ඔහුට එවැනි බන්ධනාගාරගත කිරීමේ කාලයක් දඬුවම් විඳීමට නියමව ඇත්නම් හෝ ;

(ඇ) වරද සිදු කරනු ලැබුවේ වරදකරු පරිවාස ආඥාවකට හෝ කොන්දේසි පිට මුදාහැරීමේ හෝ නිදහස් කිරීමේ ආඥාවකට යටත්ව සිටින විට දී නම්; හෝ

(ඈ) නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ කාල සීමාව හෝ එකම නඩු කටයුතුවල දී එක් වරදකට වැඩි වැරදි සංඛ්‍යාවක් සඳහා වරදකරු, වරදකරු කරනු ලබන අවස්ථාවක දී, බන්ධනාගාරගත කිරීමේ කාල සීමාවල එකතුව අවුරුදු දෙකක් ඉක්මවන්නේ නම්,

අධිකරණයක් විසින්, බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් අත්හිටුවමින්, ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(3) (මෙහි මින් මතු "ක්‍රියාත්මක වන කාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) දණ්ඩන නියමයක් සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ අත්හිටුවනු ලැබිය හැකි කාල සීමාව, ඒ දණ්ඩන නියමය සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ අත්හිටුවමින් ආඥාව කරනු ලබන විට ඒ අධිකරණය විසින් -

(අ) තීරණය කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, ඒ කාල සීමාව, දණ්ඩන නියමය සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ අත්හිටුවමින් කරනු ලබන ආඥාවේ දින සිට, අවුරුදු පහකට වඩා අඩු නොවිය යුතු ය.

(4) අත්හිටුවන ලද බන්ධනාගරගත කිරීමේ දණ්ඩන නියමයකින් දඬුවම් ලැබ සිටින වරදකරුවකු -

(අ) ඒ දණ්ඩන නියමය ක්‍රියාත්මක වන කාලය තුළ, ව්‍යවස්ථාපිත දණ්ඩනය බන්ධනාගාරගත කිරීම වන හෝ ව්‍යවස්ථාපිත දණ්ඩනයට බන්ධනාගාරගත කිරීම ද ඇතුළත් වන, වෙනත් වරදක් සිදු කළහොත් මිස ; සහ

(ආ) (13) වන උපවගන්තිය යටතේ අධිකරණයක් විසින් ආඥාවක් කළහොත් මිස,

ඒ වදරකරු, අත්හිටුවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයේ කිසිම කොටසක් සඳහා දඬුවම් විඳිනු නොලැබිය යුතු ය.

(5) දණ්ඩන නියමය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ අත්හිටුවමින් කරන ලද ආඥාවේ දින සිට, ක්‍රියාත්මක වන කාලය ගණන් බලනු ලැබිය යුතු ය.

(6) ක්‍රියාත්මක වන කාලය ආරම්භවීමට පෙරාතුව ම සිදු කරන ලද වෙනත් වරදක් සඳහා, ක්‍රියාත්මක වන කාලය තුළ දී, වරදකරුවකුට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරනු ලැබුවහොත්, වරදකරු ඒ දඬුවම විඳිමින් සිටින අතර, ක්‍රියාත්මක වන කාලය අඛණ්ඩව ගෙවී යා යුතු ය.

(7) අත්හිටුවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකින් දඬුවම් ලැබ සිටින වරදකරුවකු, ක්‍රියාත්මක වන කාලය අවසන්වීමේ දී නිදහස් කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(8) ධුරයක් සඳහා නුසුදුසුකමක් වීම සඳහා හෝ ධුරය අහිමිවීම සඳහා නැතහොත් විශ්‍රාම වැටුප් හෝ වෙනත් ප්‍රතිලාභ අහිමි කිරීම හෝ අත්හිටුවීම සඳහා විධිවිධාන සලස්වන යම් නීතියක හැර, වෙනත් නීතියක කාර්යය සඳහා, බන්ධනාගාරගත කිරීමේ අත්හිටුවන ලද දණ්ඩන නියමයක් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් ලෙස සළකනු ලැබිය.

(9) සම්පූර්ණයෙන්ම අත්හිටුවනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක සම්පූර්ණකාලය හෝ එම කාලයෙන් යම් කොටසක් දඬුවම් විඳින ලෙස (13) වන උපවගන්තිය යටතේ යම් වරදකරුවකුට ආඥා කරනු ලැබුවහොත්, එවිට, ධුරය සඳහා නුසුදුකමක් වීම සඳහා හෝ ධුරයඅහිමිවීම සඳහා හෝ විශ්‍රාම වැටුප් හෝ වෙනත් ප්‍රතිලාභ අහිමි කිරීම හෝ අත්හිටුවීම සඳහා හෝ විධිවිධාන සලස්වන යම් නීතියක කාර්ය සඳහා, ඒ උපවගන්තිය යටතේ ආඥාව කරන ලද දිනයේ දී වරදකරු, බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමකට යටත් වූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(10) (8) වන සහ (9) වන වගන්තිවල කාර්යය සඳහා "නීතිය" යන්නට, පාර්ලිමේන්තු පනතක්, යම් පාර්ලිමේන්තු පනතක් යටතේ සාදන ලද නියෝග, රීති සහ අතුරු ව්‍යවස්ථා, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සහ අමාත්‍ය මණ්ඩලය විසින් සාදන ලද හෝ අනුමත කරන ලද නීති සංග්‍රහ හෝ රීති ඇතුළත් වන්නේ ය.

(11) යම් වරදක් සඳහා වූ ව්‍යවස්ථාපිත දණ්ඩනය, බන්ධනාගාරගත කිරීම වන්නා වූ හෝ ඒ දණ්ඩනයට බන්ධනාගාරගත කිරීම ඇතුළත් වන්නා වූ වරදක් සඳහා, අධිකරණයක් විසින් තැනැත්තකු වරදකරු කරනු ලබන්නේ නම් සහ ඒ වරද, වෙනත් වරදකට අදාළව ක්‍රියාත්මක වන කාලය තුළ සිදු කරනු ලබුවේ නම්, යම් අධිකරණයක් විසින් (13) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තා සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(12) (අ) යම් වරදක් සඳහා වූ ව්‍යවස්ථාපිත දණ්ඩනය, බන්ධනාගාරගත කිරීම වන්නා වූ හෝ ඒ දණ්ඩනයට බන්ධනාගාරගත කිරීම ඇතුළත් වන්නා වූ හෝ වරදක් සඳහා තැනැත්තකු වරදකරු කරනු ලැබ ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කර ඇත්නම් සහ, ඒ වරද, වෙනත් වරදකට අදාළව ක්‍රියාත්මක වන කාලය තුළ සිදු කරනු ලැබුවේ නම්, එවිට, ඒ වෙනත් වරදට අදාළ ඒ කාරණා කියාපාමින් (1) වන උපවගන්තිය යටතේ අත්හිටුවන ලද දණ්ඩන නියමය කළ අධිකරණය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ)ඡේදය යටතේ වූ පැමිණිල්ල -

(i) යම් තැනැත්තකු විසින් ;

(ii) ක්‍රියාත්මක වන කාලය අවසානයේ සිට අවුරුදු දෙකක කාලයක් පසු නොවී,

කරනු ලැබිය හැකි ය.

(ඇ) (අ) ඡේදය යටතේ වූ පැමිණිල්ලක් ලියවිල්ලකින් විය යුතු අතර, පැමිණිලිකරුගේ දිවුරුම් ප්‍රකාශයක් මගින් එය තහවුරු කරනු ලැබිය යුතු ය.

(ඈ)(අ) ඡේදය යටතේ ලියවිල්ලකින් වූ දිවුරුම් ප්‍රකාශයකින් තහවුරු කරන ලද පැමිණිල්ලක් අධිකරණය විසින් ලද හොත්, ඒ අධිකරණය විසින් අත්හිටුවන දණ්ඩන නියමයක් නියම කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා සහ (අ) ඡේදය යටතේ පැමිණිල්ල කරන තැනැත්තා,නිශ්චිතව සඳහන් කරනු ලබන ස්ථානයක දී, දිනයකදී හා වේලාවක දී අධිකරණය ඉදිරියෙහි පෙනීසිටින ලෙසට අධිකරණය විසින් සිතාසියක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ඉ) (ඈ) ඡේදය යටතේ තැනැත්තකු වෙත නිකුත් කරන ලද සිතාසියක් ඒ තැනැත්තා වෙත පෞද්ගලිකව භාර දෙනු ලැබිය යුතු ය ; නැතහොත් ඒ තැනැත්තා අවසන් වරට වාසය කර ඇතැයි දැනගන්නට ඇති ස්ථානයෙහි තැබිය යුතු ය.

(ඊ) (ඈ) ඡේදය යටතේ අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට සිතාසි ලැබූ යම් තැනැත්තකු සිතාසියට ප්‍රතිචාර වශයෙන් අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීම පැහැර හැරියහොත්, ඒ තැනැත්තා සිරභාරයට ගෙන අධිකරණය ඉදිරියට පැමිණවීම පිණිස අධිකරණය විසින් වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(13) (අ) 12 වන උපවගන්තිය යටතේ කරන ලද පැමිණිල්ලක් විභාග කිරීමේ දී, වරද සඳහා වූ ව්‍යවස්ථාපිත දණ්ඩනය බන්ධනාගාරගත කිරීම වන්නා වූ හෝ ඒ දණ්ඩනයට බන්ධනාගාරගත

කිරීම ඇතුළත් වන්නා වූ වරදකට තැනැත්තකු වරදකරු කර තිබෙන බවට සහ අධිකරණය විසින් අත්හිටුවන ලද දණ්ඩන නියමයක් නියම කරනු ලැබුවේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරදට අදාළ ක්‍රියාත්මක වන කාලය තුළ දී ඉහත කී වරද සිදු කර ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, (7) වන උපවගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, අධිකරණය විසින් -

(i) අත්හිටුවීමට යෙදුණු දණ්ඩන නියමය හෝ දණ්ඩන නියමයේ කොටස ප්‍රනස්ථාපනය කොට ඒ දඬුවම විඳින ලෙස වරදකරුට ආඥා කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ii) දණ්ඩන නියමයේ කොටසක් හෝ දණ්ඩන නියමයේ අත්හිටුවීම යෙදුනු කොටස හෝ ප්‍රනස්ථානය කොට ඒ දඬුවම විඳින ලෙස වරදකරුට ආඥා කරනු ලැබිය හැකි ය; නැතහොත්

(iii) සම්පූර්ණයෙන් අත්හිටුවන ලද දණ්ඩන නියමයක් සම්බන්ධයෙන් වන විට, ආඥාවේ දිනයේ සිට මාස දොළහක් පසු නොවන දිනයකට, ක්‍රියාත්මක වන කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(iv) අත්හිටුවන ලද දණ්ඩන නියමය සම්බන්ධයෙන් කිසිම ආඥාවක් කරනු නොලැබිය හැකි ය.

තවද, ඊට අතිරේකව, අධිකරණය විසින් ඒ තැනැත්තාට රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයක් නියම කරනු ලැබිය හැකි ය.

(ආ) අත්හිටුවන ලද බන්ධනාගාරගත කිරීමේ කාලයක් විඳින ලෙස (අ) ඡේදය යටතේ අධිකරණයක් විසින් වරදකරුවකුට ආඥා කරනු ලැබුවහොත්. අධිකරණය විසින් අන්‍යාකාරයකින් ආඥා කරනු ලැබුවහොත් මිස, ඒ කාලය ඒ තැනැත්තා විසින් -

(i) වහාම ; සහ

(ii) වරදකරු විඳිමින් සිටින හෝ ඉදිරියට විඳීමට තිබෙන වෙනත් යම් බන්ධනාගාරගත කිරීමේ කාලයක් සමග සමගාමීව,

විඳිනු ලැබිය යුතු ය.

(ඇ) අත්හිටුවන ලද දණ්ඩන නියමය නියම කිරීමෙන් පසු, යම් තදනන්තර වරදක් පිළිබඳ කරුණු ද ඇතුළුව, උද්ගත වී ඇති හෝ දැනගන්නට ලැබී ඇති සියලු අවස්ථානුගත කරුණු හේතු කොට ගෙන, (13) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන හෝ (ii) වන හෝ (iii) වන අනුඡේදය යටතේ ආඥාවක් කිරීම යුක්ති සහගත නොවන බව අධිකරණයේ මතය වන්නේ නම් මිස, අධිකරණයක් විසින්, ඒ ඡේදය යටතේ ආඥාවක් කරනු ලැබිය යුතු අතර,අධිකරණය විසින් ඒ මතය දරන්නේ නම් ඊට හේතු අධිකරණය විසින් ලිඛිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(ඈ) (12) වන උපවගන්තිය යටතේ කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් වරදකරු පිළිබඳව වහාම කටයුතු කිරීමට අධිකරණයට නොහැකි වන්නේ නම්, අධිකරණය විසින් නියම කරනු ලබන යම් කොන්දේසි මත, අධිකරණය විසින් ඔහු ඇප පිට මුදා හරිනු ලැබිය යුතු ය.

ආඥාවේ බලපෑම අධිකරණය විසින් වරදකරුට පැහැදිලි කළ යුතු බව.

304. බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් අත්හිටුවමින් ආඥාවක් කිරීමට යෝජනා කරන අධිකරණයක් විසින්, ඒ ආඥාව කිරීමට පෙර –

(අ) වරදකරු විසින් ක්ෂණිකව අවබෝධ කරගන්නා භාෂාවකින් ඒ වරදකරුට –

(i) යෝජිත ආඥාවේ අරමුණ සහ බලපෑම ; සහ

(ii) ක්‍රියාත්මක වන කාලය තුළ දී බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැකි වෙනත් වරදක් වරදකරු විසින් සිදු කරනු ලැබුවහොත්, ඉන් සිදුවිය හැකි ප්‍රතිඵල,

පැහැදිලි කර දීම හෝ පැහැදිලි කර දීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

(ආ) වරදකරු හඳුනාගැනීම සඳහා සහ ඇඟිලි සටහන් ගැනීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය.”

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 305 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 305 වන වගන්තිය ඉවත් කිරීම.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.